# මාධ්‍ය නිවේදනය

## ජාතික ගිණුම් ඇස්තමේන්තු; 2023 වර්ෂයේ තෙවන කාර්තුව
## නිෂ්පාදන ප්‍රවේශය

**පදනම් වර්ෂය - 2015**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
**මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේ තෙවන කාර්තුව (ජුලි 1 සිට සැප්තැම්බර් 30) සඳහා නිෂ්පාදන ප්‍රවේශය යටතේ පවත්නා මිල ගණන් සහ ස්ථාවර මිල (2015) ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කර ප්‍රකාශයට පත් කොට ඇත.

2023 වර්ෂයේ තෙවන කාර්තුවේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය පෙර වර්ෂයේ තෙවන කාර්තුවේ වාර්තා වූ රුපියල් මිලියන 2,900,654 සිට රුපියල් මිලියන 2,946,107 දක්වා වැඩි වී ඇත.

2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දී පෙර වර්ෂයේ තෙවන කාර්තුවට සාපේක්ෂව දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය සියයට 1.6 ක ධන වර්ධනයක් ලෙස වාර්තා වී ඇත.

2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දී කෘෂිකාර්මික කටයුතු සියයට 3.0 ක වර්ධනයක් වාර්තා කර ඇති අතර කර්මාන්ත හා සේවා ආර්ථික කටයුතු ද පිළිවෙලින් සියයට 0.3 ක් සහ සියයට 1.3 ක් වශයෙන් වර්ධනයන් වාර්තා කර ඇත.

පටුන

**2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු පිළිබඳ සාරාංශය - පිටු අංක** 2
**2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු පිළිබඳ පසුබිම - පිටු අංක** 3
**2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු වල හැසිරීම - පිටු අංක** 3
**2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දී කර්මාන්ත ආර්ථික කටයුතු වල හැසිරීම - පිටු අංක** 3
**2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සේවා ආර්ථික කටයුතු වල හැසිරීම - පිටු අංක** 4

**Source Publication**

http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP2015

# සාරාංශය

2023 වර්ෂයේ තෙවන කාර්තුව සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ, 2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය පෙර වර්ෂයේ තෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 1.6 ක ධන වර්ධනයක් වාර්තා කර ඇති බවයි. ඒ අනුව, 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 2,900,654 ලෙස වාර්තා වී තිබූ අතර එය 2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 2,946,107 දක්වා වැඩි වී ඇත. රූපසටහන 1 මගින් තෙවන කාර්තුවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ අගය 2018-2023 අතර කාලයේ දී වෙනස් වූ ආකාරය පෙන්නුම් කෙරේ.

රූපසටහන 1
මූර්ත දළ දේශීය නිෂ්පාදිතය - තෙවන කාර්තුව 2018-2023




මූලය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

තව ද, පවත්නා මිල ගණන් යටතේ ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී රුපියල් මිලිය6,586,602 ක් ලෙස වාර්තා වූ අතර එය 2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 6,906,891 ක් දක්වා සියයට 4.9 කින් වැඩිවී ඇත.

ආර්ථිකයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා ආර්ථික කටයුතු 2023 වර්ෂයේ තෙවන කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 7.8 ක්, සියයට 28.1ක්, සියයට 57.5ක් වශයෙන් වේ. තවද භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු (සහනාධාර අඩුකළ) 2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 6.5 ක් ලෙස වාර්තා වේ.

2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දී කෘෂිකාර්මික කටයුතු සියයට 3.0 ක ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර කර්මාන්ත හා සේවා ආර්ථික කටයුතු ද පිළිවෙලින් සියයට 0.3 ක් සහ සියයට 1.3 ක් වශයෙන් ධන වර්ධනයන් වාර්තා කර ඇත.

# පසුබිම

2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය ඇස්තමේන්තු කරනු ලබන්නේ පෙර වර්ෂයේ තෙවන කාර්තුවේ වාර්තා වූ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකමට සාපේක්ෂව වේ.

විනිමය අනුපාතිකය සම්බන්ධයෙන් පැවති අවිනිශ්චිත තත්ත්වය යහපත් අතට හැරෙමින් ආරම්භ වූ 2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දී පහළ මට්ටමක මන්දගාමීව වර්ධනය වෙමින් පැවති ආර්ථිකය පිළිබද අපේක්ෂා ධනාත්මක තත්ත්වයට පරිවර්තනය වීමක් දැකිය හැකි විය. විනිමය අනුපාතිකයේ හිතකර වෙනස්වීමට සමගාමීව ආනයනික යෙදවුම් පිරිවැය පහළ වැටීම දැකිය හැකි වූ අතර පහත වැටී තිබූ ණය ඉල්ලුම පොලී අනුපාතිකයේ සිදුවූ පහළ වැටීම සමග ක්‍රමානුකූලව ධන ප්‍රතිචාර දක්වන තත්ත්වයක් තෙවන කාර්තුවේ දී නිරීක්ෂණය කළ හැකි විය.  විශේෂයෙන් සංචාරක ක්ෂේත්‍රයේ ඇතිවෙමින් පවතින උත්පාතය සමග සේවා අපනයන සම්බන්ධයෙන් ධනාත්මක තත්ත්වයක් මෙම කාර්තුවේ දී නිරීක්ෂණය කළ හැකි විය. ඒ අනුව 2023 වර්ෂයේ  තෙවන කාර්තුවේ දී නවාතැන් හා ආහාරපාන සැපයීම් කටයුතු ඉහළ ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර  කෘෂිකාර්මික බෝග වගාවන් ධන වර්ධනයක් වාර්තා කර ඇත. තව ද නිෂ්පාදන කර්මාන්ත කටයුතු සමහරක් ද ධන වර්ධනයන් වාර්තා කර තිබීම මෙම කාර්තුවේ දි දැකිය හැකි විය.

# කෘෂිකාර්මික ආර්ථික කටයුතු වල වර්ධනයන්

කෘෂිකාර්මික ආර්ථික කටයුතු 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 6.7ක පසුබැසීමක් වාර්තා කර තිබූ අතර 2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දී එය පෙර වර්ෂයේ තෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 3.0 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

එහිදී 'ධාන්‍ය වගා කිරීම' (සියයට 33.2), 'කරදිය ධීවර කටයුතු' (සියයට 27.5) , 'වී වගා කිරීම' (සියයට 23.2), කෘෂිකාර්මික සහය සේවා කටයුතු (සියයට 20.9), 'සත්ව නිෂ්පාදන කටයුතු' (සියයට 5.4),  'පළතුරු වගා කිරීම' (සියයට 5.4), 'කෝපි කොකෝවා සහ අනෙකුත් පානීය බෝග වගා කිරීම' (සියයට 3.8), 'එළවළු වගා කිරීම' (සියයට 3.2) සහ 'උක් වගා කිරීම'(සියයට 3.1) වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

කෙසේ වෙතත් 'පැළ බෝකිරීම' (සියයට 36.8), 'වන වගා සහ දැව කදන් නිෂ්පාදනය' (සියයට 30.7), 'මිරිදිය ධිවර කටයුතු' (සියයට 10.3), 'පොල් ඇතුලත් තෙල් සහිත පළතුරු බෝග වගාව' (සියයට 6.1), 'අනෙකුත් ස්ථාවර බෝග වගාව' (සියයට 3.9), 'කුළු බඩු වගා කිරීම' (සියයට 3.6), 'රබර් වගා කිරීම' (සියයට 2.8), 'තේ වගා කිරීම' (සියයට 1.4) ක් වශයෙන් ඍණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

# කර්මාන්ත ආර්ථික කටයුතු වල වර්ධනයන්

කර්මාන්ත ආර්ථික කටයුතු 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 21.3ක පසුබැසීමක් වාර්තා කර තිබූ අතර 2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දී එය පෙර වර්ෂයේ තෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 0.3 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. කර්මාන්ත ආර්ථික කටයුතු අතුරින් 'ඉදිකිරීම් කර්මාන්තය' මෙම කාර්තුවේ දී සියයට 5.5ක පසුබැසීමක් වාර්තා කර ඇති නමුත් 'පතල් හා කැනීම් කර්මාන්තය' සියයට 0.7ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

තව ද නිමැවුම් කර්මාන්ත කටයුතු සමස්තයක් වශයෙන් සියයට 2.1 ක ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර එහිදී ප්‍රධාන නිමැවුම් කර්මාන්ත කටයුතු සමහරක් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. එහිදී 'පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන කර්මාන්තය' (සියයට 168.6), 'මූලික ලෝහ සහ ව්‍යුවහාත්මක ලෝහ නිෂ්පාදනය' (සියයට 29.9), 'ගෘහ භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 28.7), 'අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනය' (සියයට 17.5), 'ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය' (සියයට 11.8), 'රසායනික ද්‍රව්‍ය හා මූලික ඖෂධ වර්ග නිෂ්පාදනය' (සියයට 4.2) වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් 'දැව හා දැව ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 19.0), ' යන්ත්‍රසූත්‍ර හා උපකරණ අලුත්වැඩියාව හා ස්ථාපිත කිරීම් ඇතුළත් අනෙකුත් වර්ග නොකළ නිෂ්පාදන කර්මාන්ත කටයුතු' (සියයට 18.9),'රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 16.5), 'රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ

සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන කටයුතු' (සියයට 10.1), 'යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිෂ්පාදනය' (සියයට 11.4), 'කඩදාසි සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනය' (සියයට 1.5) වශයෙන් පසුබැසීම් මෙම කාර්තුවේ දී වාර්තා කර ඇත.

2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දී කර්මාන්ත අංශයේ ආර්ථික කටයුතු අතුරෙන් 'විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම' සහ 'ජලය එක් රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම' පිළිවෙලින් සියයට 4.2 ක් සහ සියයට 11.9 ක් වශයෙන් ධන වර්ධනයන් වාර්තා කර ඇත.

## සේවා ආර්ථික කටයුතු වල වර්ධනයන්

සේවා ආර්ථික කටයුතු 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 4.2ක පසුබැසීමක් වාර්තා කර තිබූ අතර 2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දී එය සියයට 1.3ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

එහිදි 'මූල්‍ය සේවා' (සියයට 0.5) පසුබැසීමක් වාර්තා කර ඇති නමුත් 'රක්ෂණ සේවා' (සියයට 29.6) ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. තව ද 'නවාතැන් හා ආහාර පාන සැපයීම' (සියයට 34.9), 'වැඩසටහන් සම්පාදනය සහ ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන කාර්යයන්' (සියයට 10.9), 'භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය සහ ගබඩාකරණ කටයුතු' (සියයට 5.7), 'තැපැල් හා කුරියර් සේවා' (සියයට 3.3), 'වෘත්තීය සේවා' (සියයට 1.9), 'අධ්‍යාපන සේවා' (සියයට 1.8), 'සෞඛ්‍ය සේවා' (සියයට 1.0), 'තොග හා සිල්ලර වෙළඳාම' (සියයට 0.9) සහ 'අනෙකුත් පෞද්ගලික සේවා' (සියයට 0.6) ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් 'තොරතුරු තාක්ෂණ සේවා' (සියයට 20.1), 'දේපොළ වෙළඳාම් සහ නිවාස අයිතිය' (සියයට 5.7) සහ 'විදුලි සංදේශ සේවා' (සියයට 2.6) ක් වශයෙන් පසුබැසීම් මෙම කාර්තුවේ දී වාර්තා කර ඇත.
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරන පරිදි 2023 වර්ෂයේ තෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු පිළිබඳ විස්තරාත්මක තොරතුරු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කර ඇත.
http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP2015



පී.එම්.පී.අනුර කුමාර
අධ්‍යක්ෂ ජනරාල්

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දැක්ම**

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුළින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මෙහෙවර**

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මගින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සංඛ්‍යාන මන්දිරය
අංක.306/71,පොල්දූව පාර
බත්තරමුල්ල

info@statistics.gov.lk
+94 11 2147000
+94 11 2147011
statistics.gov.lk

මෙය ජාතික ගිණුම් අංශයේ ප්‍රකාශනයකි.

තෙවන මහල, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
National.accounts@statistics.gov.lk
+94 11 2147071
+94 11 2877938